"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax 2092601
ඊ-මේල් / ஈமெயில் / Email chiefsecretary@wpc.gov.lk

මගේ අංකය. / எனது இல. / My No. } CSWP/PLN/56/FI/01 ඔබේ අංකය. / உமது இல. / Your No. } දිනය. / திகதி / Date } 2019.03. 13

21 MAR 2019

බස්නාහිර පළාත් චක්‍රලේඛ අංක 2019/ PMS /01

බස්නාහිර පළාතේ
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**පළාත් සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම, මෙහෙයවීම හා ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධව සකසන ලද ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංග පද්ධතිය (Project Management System) භාවිතයට ගැනීම**

බස්නාහිර පළාත් වාර්ෂික ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම යටතේ සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම, මෙහෙයවීම, ඇගයීම හා නියාමනය යන ක්‍රියාවලිය සම්බන්ධව සකසන ලද ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් (Online) බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු සංවිධානය කර ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැනනගින බොහෝ ගැටළු මෙම තොරතුරු පද්ධතිය මගින් කඩිනමින් විසදා ගැනීමට හැකිවන පරිදි අදාල මෘදුකාංග පද්ධතිය සකස් කර ඇති අතර මෙමගින් පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමේ හැකියාව ඇත.

- ව්‍යාපෘති කළමණාකරන ක්‍රියාවලිය සඳහා ගත වන කාලය අවම කර ගැනීම.
- විවිධ වැඩසටහන්, ව්‍යාපෘති සඳහා වාර්ෂිකව වෙන්කරනු ලබන ප්‍රතිපාදන පූර්ණ උපයෝජනයක් සහිතව යෙදවීමේ හැකියාව.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සම්බන්ධ වන සියළු පාර්ශවයන් අතර පවතින අන්තර් සම්බන්ධතාවය ශක්තිමත් කර ගැනීම.
- ව්‍යාපෘති හා සම්බන්ධ තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේදී පැන නගින ගැටළු සම්බන්ධව ආයතන ප්‍රධානීන්ට සෘජුවම මැදිහත්වීමේ හැකියාව.

මෙම දත්ත පද්ධතිය 2019.03.01 දින සිට භාවිතයට ගැනීමට තීරණය කර ඇති අතර පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කළ යුතු බව අවධාරණය කරමි.

(1) බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම්, මූල්‍ය, ඉංජිනේරු අංශ හා සියළුම බස්නාහිර පළාත් අමාත්‍යාංශ/ආයතන ඒකාබද්ධ කරමින් මෙම තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක වන බැවින් එක් එක් අමාත්‍යාංශ/ආයතන වෙත එමගින් පැවරී ඇති වගකීම් හා කාර්යයන් නිසි පරිදි ඉටු කිරීම.

(2) ව්‍යාපෘතියක් අනුමත කිරීමේ සිට එහි වැඩ අවසන්වන තෙක් සිදුවන ක්‍රියාවලියේදී , එම ව්‍යාපෘතිය හා සම්බන්ධ තොරතුරු ඇතුලත් කිරීම , එම ව්‍යාපෘතිය අනුමත කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශය , ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දීම යන කරුණු සම්බන්ධව එක් එක් නිලධාරින්හට වෙන්වෙන් වශයෙන් වගකීම් පැවරෙන ආකාරයට මෙම මෘදුකාංග පද්ධතිය මගින් පහසුකම් සලසා ඇත. ඒ අනුව ඔබ ආයතනය තුල අදාල වගකීම් පවරා ඇති නිලධාරින්ට අදාල රාජකාරි නිසිලෙස පැවරීම.

(3) බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ මුලා, ඉංජිනේරු, සැලසුම් අංශ හා සියළුම පළාත් අමාත්‍යාංශ හා ක්‍රියාත්මක බලධාරින් ඒකාබද්ධව විවිධ වැඩසටහන්, ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කරදීම, නිදහස්කරදීම හා එම ප්‍රතිපාදන වල මාසික වියදම් වාර්තා පිළිබඳ තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුලත් කිරීම.

(4) ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංග පද්ධතිය පිළිබඳ නිසි අවබෝධයක් ලබා ගනිමින් 2019.03.01 දින සිට ව්‍යාපෘති අනුමත කිරීම,ඇගයීම,ප්‍රගතිය යාවත්කාලීන කිරීම මෙම මෘදුකාංග පද්ධතියෙන්ම සිදු කිරීම අනිවාර්ය වන අතර ඒ බව අදාළ ක්‍රියාත්මක බලධාරින් වෙතද දැනුවත් කළ යුතුය.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන ව්‍යාපෘති කළමණාකරන මෘදුකාංග පද්ධතියට ව්‍යාපෘති ඇතුලත් කිරීමේදී තව දුරටත් ගැටළු පවතින්නේ නම්, ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයේ සහකාර අධ්‍යක්ෂ එම්.එම් නිමල් ප්‍රේමතිලක මහතා ( දුරකථන අංක 0775196026 , 0112092537) හා සම්බන්ධ වී ඒ සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ප්‍රදීප් යසරත්න

ප්‍රධාන ලේකම් කාර්යාලය

බස්නාහිර පළාත.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම්<br>பிரதி பிரதம செயலாளர்<br>Deputy Chief Secretary | පාලන<br>நிர்வாகம்<br>Administration | පිරිස් හා පුහුණු<br>ஆளணி மற்றும் பயிற்சி<br>Personnel & Training | මුදල<br>நிதி<br>Finance | සැලසුම්<br>திட்டமிடல்<br>Planning | ඉංජිනේරු<br>பொறியியல்<br>Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක<br>பிரதான உள்ளகக் கணக்காய்வாளர்<br>Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel: 2092606<br>Fax: 2092605<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 2092631<br>Fax: 2092647<br>dcspt@cs.wpc.gov.lk | Tel: 2092640<br>Fax:2092636<br>csfinance@wpc.gov.lk | Tel: 2092532<br>Fax:2092533<br>dsplancs@wpc.gov.lk | Tel: 2092501<br>Fax:2092505<br>dsengcs@wpc.gov.lk | Tel: 2092628 |